**සිසු සාධන මට්ටම් හඳුනාගැනීමේ තක්සේරුකරණය -2022**

**මධ්‍යම පළාත**


**10 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය - පැය 2 යි**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

**1 කොටස**

01. $\sqrt{2} = 1.41$ නම් $\sqrt{50}$ හි අගය සොයන්න.


02. $x\,(x-2) + 3\,x$ වරහන් ඉවත් කර සුළු කරන්න.

03. 

රූපයේ දී ඇති තොරතුරු අනුව a හා b හි අගය සොයන්න.


04. 2022 සංඛ්‍යාව විද්‍යාත්මක අංකනයෙන් ලියන්න.

05. අරය 7 $cm$ වන කේන්ද්‍රික ඛණ්ඩ කොටසක් රූපයේ දැක්වේ.
එහි චාප කොටසේ දිග සොයන්න.




06. සාධක සොයන්න. $x^2 + 17x + 16$


07. ඝනකාභ හැඩැති භාජනයක 5 $cm$ උසට ද්‍රව පිරී ඇති විට එහි පරිමාව 1 $l$ කි. මෙම භාජනයේ පතුලේ වර්ගඵලය සොයන්න.

08. 

රූපයට අනුව PQRST පංචාස්‍රයේ $x$ හි අගය සොයන්න.

09. සංඛ්‍යා රටාවක සාධාරණ පදය $(2n - 3)$ වේ. එහි මුල් පද තුන ලියන්න.

10. වියදම රුපියල් 1800 ක් වූ සපත්තු ජෝඩුවකින් 15% ක ලාභයක් ලැබීමට නම් එය විකිණිය යුතු මිල කීය ද?

11. 


රූපයේ දී ඇති මිනුම් අනුව ත්‍රපීසියමේ වර්ගඵලය සොයන්න.


mathematica.lk

12. $v = u + at$ සමීකරණයේ $a$ උක්ත කරන්න.

13. $(0 , 4)$ හා $(1 , 2)$ ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියන්න.

14. 1 ත් 20 ත් අතර ඇති ප්‍රථමක සංඛ්‍යා ලියන ලද සමාන තුණ්ඩු කැබලි අතරින් අහඹු ලෙස ගන්නා තුණ්ඩුවට අදාළ නියැදි අවකාශය ලියා දක්වන්න.


15. විසඳන්න. $\frac{x}{2} + \frac{x}{3} = 1$

16. 


$A\hat{O}B$ සරල රේඛාවකි. $C\hat{O}B = 73^0$ නම් $A\hat{O}C$ හි අගය සොයන්න.


17. $\frac{x^3 \times x^0}{x^2}$ සුළු කරන්න.

mathematica.lk

18. 


ABCD සෘජුකෝණාස්‍රයේ BD විකර්ණයේ දිග සොයන්න.

19. පෑන් 3 ක මිල රුපියල් 54 ක් නම් පෑන් 5ක මිල සොයන්න.

20. 


දී ඇති රූපයේ $D\hat{O}B = C\hat{O}A$ නම් එහි තවත් සමාන කෝණ යුගලයක් ලියන්න.

01. $y = 3x + 1$ ශ්‍රිතය ප්‍රස්ථාරගත කිරීම සඳහා අසම්පූර්ණ අගය වගුවක් පහත දැක් වේ.

mathematica.lk

| x | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| y | -8 | ……. | -2 | ……. | 4 | 7 | 10 |

i) අගය ලබාගත් අයුරු දක්වමින් වගුවේ හිස්තැන් පුරවන්න.

ii) සුදුසු පරිමාණයකට ඉහත තොරතුරු ප්‍රස්ථාරගත කරන්න.

iii) ශ්‍රිතයේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය සොයන්න.

---

02. එක්තරා ආයතනයක මාසයක් තුළ ලබාගත් දුරකථන ඇමතුම් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක් වේ.

| ඒකක ගණන | 04 | 07 | 10 | 13 | 15 | 19 | 25 |
|---|---|---|---|---|---|---|---|
| දින ගණන | 02 | 03 | 05 | 07 | 06 | 04 | 03 |

i) ඉහත තොරතුරුවල මාතය හා මධ්‍යස්ථය සොයන්න.

ii) දිනකදී ලබාගත් මධ්‍යන්‍ය දුරකථන ඇමතුම් සංඛ්‍යාව සොයා ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.

iii) ඒකක 10 කට වඩා ඇමතුම් ලබා ගත් දින ගණන සොයන්න.

---

03. 8, 11, 14, …… යන සංඛ්‍යා රටාවේ,

mathematica.lk

i) ඊළඟ පද දෙක ලියන්න.

ii) මෙම සංඛ්‍යා රටාවේ සාධාරණ පදය ලියන්න.

iii) සාධාරණ පදය භාවිතයෙන් රටාවේ විසිවෙනි පදය සොයන්න.

iv) 80 මෙම රටාවේ කීවන පදය ද?

---


04. ශ්‍රීමාල් ඔහුගේ ඉඩමකින් $\frac{2}{5}$ ක් බිරිඳට ද, $\frac{3}{10}$ ක් ඔහුගේ පුතාට ද, ඉතිරිය දියණියට ද දෙන ලදී.

i) බිරිඳට සහ පුතාට දුන් කොටස කොපමණ ද?

ii) දුවට දුන් කොටස කොපමණ ද?


iii) බිරිඳට දුන් කොටස හෙක්ටයාර් 20 ක් නම් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණ ද?

05. හේතු දක්වමින් a , b , c , d, e කෝණවල අගය සොයන්න.



mathematica.lk

06.



mathematica.lk

i) PQRS සමචතුරස්‍රයේ වර්ගඵලය කොපමණ ද?

ii) PQRS සමචතුරස්‍රයේ පරිමිතිය සොයන්න.

iii) මෙම සමචතුරස්‍රයෙන් කපාගත හැකි විශාලම වෘත්තයේ විශ්කම්භය හා අරය සොයන්න.

iv) විශාලම වෘත්තයේ වර්ගඵලය සොයන්න.

v) විශාලම වෘත්තය කපාගත් පසු ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න.

*****

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න